පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
සබරගමුව සති පාසල

සතිය :- 3

විෂය:- පෙරදිග සංගීතය

Prepared by - H.D.V.K.C.Ilangarathna. Kg/Dehi/Gonagala North K.V.

ශ්‍රේණිය :- 10

Department of Education,Sabaragamuwa Province/ Weekly School

# රෝහණ බැද්දගේ මහතා

### රෝහණ බැද්දගේ



- වර්ෂ 1935 නොවැම්බර් මස 01 දින රයිගම් කෝරළයේ උඩුව නම් ගම්මානයේ දී එතුමා උපත ලැබී ය.

  ජන සංගීතය සඳහා ඔහුගේ මූලික අධ්‍යාපන පීඨය වූයේ ඔහු උපන් ගම්මානය යි. ගමේ දේවාලය භාර කපු පරම්පරාවේ සාමාජිකයකු වීම පහතරට නැටුමත්, එම බෙර වාදනයත් දායාද කොට ගැනීම හා සමාන විය. ගමේ කෝලම් නැටුම් කණ්ඩායමටත්, කවි නාඩගමටත් එක් වීම ඔහුගේ දෛවෝපගත සිද්ධිදාමයක ආරම්භය විය. කතුරු මැඩිල්ලාවේ මැඩිලි වැරම් ගායනයත්, සන්නි යකුම් වැනි තොවිල් පළවල්හි දී එළි වෙන තුරු බෙර වාදනය කිරීමත්, දීර්ඝ ගමනක මුල පිරුමක් විය.

- මූලික අධ්‍යාපනය සඳහා උඩුව කනිෂ්ඨ විද්‍යාලයට ඇතුළත් විණි.

  ගොවිතැන් වැඩෙහි ගොයම් කැපීම, අඩනැර පෑම, සී සෑම, පැල් රැකීමේ දී පැල් කවි ගායනය ආදියෙහි යෙදීම එතුමාගේ කලා ජීවිත අධ්‍යාපනයේ මූලික අඩිතාලම විය.

- ද්විතීයක අධ්‍යාපනය ලැබුවේ හොරණ තක්ෂිලා මධ්‍ය මහා විද්‍යාලයෙනි.

  ඒ ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබීමේ අපේක්ෂාවෙනි. එම විද්‍යාලේ දී උඩරට නර්තනය හැදෑරීමට අවස්ථාව ලැබීම ද දෛවෝපගත සිදුවීමක් විය. එය ඔහුගේ මහත් වාසනාවක් විය. එහි ප්‍රතිඵලය වූයේ පාසලින් අස්වීමටත් පෙර උඩරට නැටුම්, ගාන්ධර්ව අවසාන විභාගයෙන් සමත් වීමට ලැබීම යි. උඩරට නැටුමේ ගායනා අසා එවකට සිටි ලයනල් එදිරිසිංහ මහතාගේ ඇවිටිලීමෙන් එවකට රජයේ සංගීත විද්‍යාලය වශයෙන් හඳුන්වනු ලැබූ 'හේවුඩ්' කොලීජියට ඇතුළත් විණි. එහි දී සංගීතය ද හදාරා ඇත. එතුමාගේ සංගීත ගුරුවරුන් වූයේ ඩබ්ලිව්. ඩී. අමරදේව, බී. වික්ටර් පෙරේරා වැනි ශ්‍රේෂ්ඨ සංගීතඥයෝ පිරිසකි.

- වසර 1959 දී නැටුම් ගුරුවරයකු ලෙස රජයේ සේවයට බැඳුණේ ය.

  මෙය දේශීය සංගීතයක අවශ්‍යතාව මෙහෙවින් දැනුණු අවදියකි. මකුලොලුව මහතා මුණගැසීම මෙතුමාගේ ගවේෂණාත්මක චින්තනය අවදි කරලීමට ලැබුණු මහඟු අවස්ථාවක් විය. අපේ කියා කීමට කිසිවක් ඉතිරි කරගන්නට ඉන් ඉඩක් ලැබීම රටේ ද භාග්‍යයක් විය.

වසර කිහිපයකට පසු ව මකුලොලුව මහතාගේ හෙළ මිහිර ජන ගීත කණ්ඩායමේ සාමාජිකයකු වූ පසු, දිවයිනේ විවිධ පළාත්වල පැවති ජන ගී ඇසුරෙන් එතුමා විසින් නිර්මාණය කරන ලද 'දෙපානෝ...' නම් ගීත නාටකයේ ශිල්පියකු ලෙස එයට සහභාගී වීමට ලැබීම රෝහණ බැද්දගේ මහතාගේ ජන සංගීතය පිළිබඳ දැනුම තවත් පුළුල් වීමට හේතුවක් විය.

1970 වසරේ දී සී. ද. එස්. කුලතිලක මහතා විසින් ගුවන් විදුලියේ ඉදිරිපත් කළ ජන සංගීත පර්යේෂණ නිර්මාණ සඳහා දායකත්වය ලබා දීමට ලැබීම මෙතුමාගේ ඉදිරි ගමනට මෙහෙවින් බලපෑවේ ය.

දේශීය සංස්කෘතිය ඉතා ඉහළින් ඇගයූ දයානන්ද ගුණවර්ධන සූරීන්ගේ ජසයා හා ලෙංචිනා, ගජමන් පුවත, මධුර ජවනිකා, ආනන්ද ජවනිකා වැනි නිර්මාණ සඳහා සංගීතය සැපයීම බැද්දගේ මහතාගේ නිර්මාණ කෞශල්‍යය උරගා බැලීමට ලැබුණු මහත් අවස්ථාවක් විය.

1985 දී ලන්ඩනයේ පැවති පොදු රාජ්‍ය මණ්ඩලයේ ඉන්දියානු සාගර කලාපීය රටවල සංගීත සම්මේලනයේ දී "..ජාවා, සුමාත්‍රා, මුරුසි, සිංගප්පූරුව, සැන්සිබාර්, ඉන්දියාව, ටැන්සානියාව..." වැනි රටවල ජන සංගීතය අසා තේරුම් ගැනීමටත් ඔවුන් හා එක් ව සහභාගී වීමටත් හැකි වීම ද, ජාවා, සුමාත්‍රා, දේශයන්හි ගැමිලන් සංගීත භාණ්ඩ වාදනය කරමින් එම භාණ්ඩයෙහි සාමාජිකයකු වීම ද, මෙතුමා ලැබූ තවත් භාග්‍යවත් අවස්ථාවකි.

එහි දී උතුරු ඉන්දියානුවන් හින්දුස්ථානි නිදර්ශන දැක්වීමෙන් පසු ව අපේ සංගීතාංගවල විශේෂතා හඳුන්වා දීමට දායක වී ඇත්තේ මෙතුමා ය. අපේ **පංච තාලය** පිළිබඳ ව නිදර්ශන සහිත ව බෙර වාදනය කිරීම ද, රෝහණ බැද්දගේ මහතා අතින් ඉටු වීම එක් සුවිශේෂතාවකි.

- එම 1986 දී සේවයෙන් විශ්‍රාම යන විට එතුමා නර්තන විෂයේ ප්‍රධාන අධ්‍යාපන නිලධාරි තනතුරට පත් විය.
- එම 1986 / 1991 අතර කාලයේ සෞන්දර්ය විශ්ව විද්‍යාලයේ බාහිර කථිකාචාර්යවරයකු ලෙස ද, සේවය කළේය.

  තව දුරටත් කලා ක්ෂේත්‍රයේ නිර්මාණ කිරීමේ හැකියාව මෙතුමා සතු වීම සහෘදයන්ගේ වාසනාවකි.

**රෝහණ බැද්දගේ මහතා පිළිබඳ ව ඊ නැණ පියසේ 10 වසර සාමාන්‍ය පාඩම් වෙත යොමු වන්න. අන්තර්ජාලයේ මෙතුමා පිළිබඳ තොරතුරු රැසක් හා නිර්මාණ රැසක් පවතින අතර ඒවා නරඹා අවබෝධ කරගන්න. පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

**ක්‍රියාකාරකම**

1. **රෝහණ බැද්දගේ මහතා පිළිබඳ පහත ශීර්ෂ යටතේ වගුවක් සකසන්න.**

| උපන්දිනය හා උපත ලැබූ ප්‍රදේශය | වඩාත් දක්ෂතා දක්වන විෂය ක්ෂේත්‍ර හා වෘත්තීය ම දායකත්වය | සංගීතය සැපයූ නිර්මාණ | දායකත්වය සැපයූ ගීත නාටකය | ගායනා කළ ගීත |
|---|---|---|---|---|
| | | | | |